10 ශ්‍රේණිය

සිංහල

ගුත්තිල වෙණ නද

(වෑත්තෑවේ හිමි විසින් කෝටිටේ අවධියේ රචනා කරන ලද්දකි)

සැකසුම හා අන්තර්ගතය - කේ. ඒ. ඉන්දික නිරෝෂන් - වයඹ/කිවුලකැලේ මහා විද්‍යාලය , පුත්තලම.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

කතුවරයා

වැත්තෑවේ හිමි.

පන්සිය පනස් ජාතක පොතේ 292වන ගුත්තිල ජාතකය ඇසුරින් රචිත පද්‍ය 511කින් යුතු කෘතියකි.

සිරි පැරකුම් රජුගේ අගමැතිවරයෙකු වූ සලාවත ජයපාල මැතිදුන්ගේ ආරාධනයෙන් රචිතය.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

ගුත්තිල ජාතකයේ සංක්ෂිප්තය

උදේනි පුරයට පැමිණි වෙළඳුන් ගෙන් ගුත්තිල ඇඳුරිදුගේ කීර්තිය දැන ගත් මූසිල ගාන්ධර්වයා විණා ශිල්පය හැදෑරීමට බරණැසට පැමිණෙයි . ගුත්තිල ඇඳුරිදුගෙන් සියලු ශිල්පයෙහි කෙල පැමිණි මූසිල, ගුත්තිල ඇඳුරුතුමාගේ පිහිටෙන් රාජ්‍ය සේවයට වරම් ලබයි. තමන් සිය ගුරුවරයා හා සමාන යයි සිතූ මූසිල තෙමේ තමන්ට ද සමාන වැටුප් ඉල්ලා සිටියි. රජුගේ නියෝගය පරිදි මූසිල තරුණයා තම ගුරුවරයා හා වාදයකට සූදානම් වෙයි. මේ අභියෝගයෙන් ගුරුවරයාගේ සිත සක්දෙව් රජුගේ පඬුපුල් අස්න ද හුණුවන තරම් වේදනාවට පත්වෙයි. සක්දෙව් රජුගේ මැදිහත් වීමෙන් ප්‍රතිවාදියා අපකීර්තියට පත් කිරීමට ගුත්තිල ගාන්ධර්වයාට හැකි වෙයි. සක් දෙවිඳුගේ ඇරයුමෙන් දෙව්ලොවදී විණා වාදනයට ද ගුත්තිල අඳුරුතුමාට හැකි වෙයි. එහි දී දෙවඟනෝ දෙව්ලොව උපත ලැබූ සැටි හෙළි කරමින් කුසලානිසංස මහිමය කියා පෑහ.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

ගුත්තිල කාව්‍යයේ පසුබිම (ජන ප්‍රවාදයකි)

කාව්‍යකරණයෙහි හසල දැනුමැති වෑත්තෑවේ හිමියන් තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ගේ ගෝලයෙකි. ගෝලයාගේ හැකියාව දුටු රාහුල හිමියන් තමා තුළ පැවති අප්‍රසාදය පළ කරන්නට උපායක් ලෙස අතවැසියෙකු අමතා වෑත්තෑවේ හිමියන්ට දිනපතා පලා කොළ තුන් පංගුවක් බෙදන ලෙසට උපදෙස් දී ඇත. තමාට ‘ පල නොකියා පලා බෙදන ’ බව වටහා ගත් වෑත්තෑවේ හිමි පෙරළා ගමට වැඩ, තමා ආකෘතඥයකු නොවන බව ගුරුතුමාට ඇගවීම සඳහා ගුත්තිල කතාව අත්‍යර්තයෙන් ම උචිත බැවින් ඒ ඇසුරෙන් කාව්‍යයක් පටබඳින්නට සිතයි.

සිය පින් සිරින්	සරු
දෙතිස් ලකුණෙන්	විසිතුරු
කෙලෙසුන් කෙරෙන්	දුරු
වදිමි මුනි උතුමන්	තිලෝගුරු

ලෙස ලඝු අකුරු දෙකක් හා ගුරු අකුරකින් යුතු ‘වායුගණයෙන්’ කාව්‍යය ආරම්භ කළේ ද එහි අනිෂ්ට විපාක දැනදැන ම බව ජන ප්‍රවාදයේ එයි.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

ගුත්තිල වෙණ නද

1. ගුත්තිල ඇදුරු සඳ
   විණා වයන ලෙස ඉඳ
   පසෙක පනවන ලද
   සුදුසු අස්නෙක ගොසින් උන් සඳ

අර්ථය

ගුත්තිල ඇඳුරුතුමාට ඉඳ ගෙන විණා වාදනය පිණිස පසෙකින් සූදානම් කළ සුදුසු අස්නෙක ගොසින් සිටින කල්හි

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

ගුත්තිල වෙණ නද

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

2 නො දැන ම තමා බල
සබයට අවුත් නො නොපැකිළ
වැඳ රද පද කමල
දෙසෙක මුසිලයා ද උන් කල

අර්ථය

සිය හැකියාව නොදත් මූසිල ද පැකිලීමකින් තොරව සභාවට පැමිණ රජුගේ පාද නමැති කමල වැඳ , පැත්තක උන් කල්හි

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

3 සිදු වේ මැ යි වෙසෙස
මහ බෝසතුන් අදහස
ඉන් සුර පුරෙන් බැස
අවුත් බෝසත්හු දිනවන ලෙස

අර්ථය

විශේෂයෙන් මහ බෝසතුන්ගේ අදහස සිදුවන හෙයින් දිව්‍ය ලෝකයෙන් බැස බෝධිසත්වයන් දින වන පරිද්දෙන් පැමිණ.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

4 කැර මිණි බරණ රැස්
රසින් සුර සැවූ සුවහස්
සුරන් සහ සහසැස්
නො කැර සිටියේ අහස් කුස හිස්

අර්ථය

මැනික් ආභරණ රාශින්ගේ රශ්මියෙන් බොහෝ දේදුනු ලක්ෂ ගණන් ඇති කොට, ශක්‍ර දේවයන් ද දෙව් සේනාවන් සමඟ අහස් ගැබෙහි පිරී සිටියෝ ය .

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

5 දෙදෙන ම ඉඳ දෙ පිට
සව් සත සතන් තුටු කොට
සුර ගඳඹුන් ලෙසට
පටන් ගෙන වෙණ ගායනාවට

අර්ථය

ගුත්තිල මූසිල දෙදෙනා දෙපැත්තෙහි හිඳ ගෙන, සියලු සත්වයන්ගේ සිත් සතුටු කරමින් දිව්‍ය ගාන්ධර්වයන් මෙන් වීණා ගායනාවට පටන් ගෙන,

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

6 නවතා ගිගිරියේ
අසන ලෙස සිත් පිරියේ
කැර කන් බිහිරියේ
කරත වෙණ ගායනා සරියේ

අර්ථය

සියළු මිනිසුන්ගේ ගෝෂාව නවත්වා, සෙසු සියලු ශබ්ද නොඇසෙන පරිද්දෙන් චිත්ත ප්‍රීතියෙන් යුතුව අසන ලෙස, සම සමව වීණා ගායනා කරන කල්හි,

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

7 අප බෝසතුන් මිස
අනෙකකු නො ම අසන ලෙස
සුර රජ සිට අහස
තතක් සිඳුව යි කී ය එ විගස

අර්ථය

ඒ අවස්ථාවේ අප බෝසතුන් හැර අන් කිසිවෙකුට නොඇසන පරිද්දෙන් ශක්‍ර දෙවියන් අහසෙහි සිට, තතක් කඩන්න යි කීය.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

8 ගුත්තිල මහ සිපී
සක් දෙව් බසින් සැතපී
මින් දිනමැ යි දැපී
බමර තත පළමුවෙන් සිඳපී

අර්ථය

ගුත්තිල මහා ශිල්පියා සක් දෙවිගේ වචනයෙන් සතුටුව 'මෙයින් දිනමි' යි එඩිතරව, පළමුව ප්‍රධාන තත සිඳ දැමීය.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

9 තතු මතු ද සින්දේ
පිළිමල් දප ද සින්දේ
යස දිගත ඇන්දේ
විජය සිරි සඳ ගෙන වැලැන්දේ

අර්ථය

ජයග්‍රහණය නම් ශ්‍රියා කාන්තාව වැලඳ ගනිමින්, සිය කීර්තිය දස දිශාවෙහිම පතුරවමින්, ප්‍රධාන තන්තුව පමණක් නොව, ප්‍රතිවාදියාගේ ආඩම්බරය ද බිඳ දැමී ය.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

10 සුන් එ තතින් එ සඳ
පසු කැර සුරන් වෙණ නද
දියුණු දියුණු ව නද
නික්ම පැතිරෙත දසත විනිවිද

අර්ථය

සිඳින ලද එම තන්තුවෙන්, දෙවියන්ගේ වීණා නාදය ද පසු කරමින් දෙගුණ දෙගුණව නිකුත් වූ නාදය දස දිශාවම පසා කරමින් පැතිරෙන කල්හි.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

11 කෙළෙහි ගුණ සින්දේ
මූසිල අන්ද මන්දේ
ජයෙහි ලොබ බැන්දේ
තමා විණා තත ද සින්දේ

අර්ථය

කළ උපකාරයෙහි ගුණය නොතැකූ මූසිල, සිදුවූ දෙයින් සිදුවූ දෙයින් අන්ද මන්ද වී(වික්ෂිප්තව) තමාගේ වීණාවේ තත ද සින්දේ ය.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

12 අනුවණකම් කෙළේ
ගුරුන් ගුණ සිහි නො කළේ
නද ඉන් නො පතළේ
අයස ම ය මුළු දියත පතළේ

අර්ථය

අනුවනකම් කිරීම, ගුරුන් ගුණ සිහි නො කිරීම හේතුවෙන් නාදය නො පැතිරුණේ ය. මුළු ලොවෙහිම පැතුරුණේ අපකීර්තිය ම ය.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

13 දෙ වැනි තුන් වැනි තත
සතර වැනි පස් වැනි තත
ස වැනි සත් වැනි තත
මෙ සේ සිඳී සඳ මෙ අප බෝසත

අර්ථය

මෙලෙසින් අප බෝධි සත්වයන් දෙවන ,තුන් වන, සතර වන , පස්වන,හයවන, සත්වන තත් ද සිඳී අවස්ථාවේ .

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

14 දිය දිය ගොස පළ කෙරෙමින් සපැමිණි
ගිය ගිය තැන ඉස්වා රන් මුතු මිණි
ගිය ගිය දිය නද එන මෙන් ගෙන මිණි
සිය සිය ගුණයෙන් වෙණ නද නික්මිණි

අර්ථය

ගුත්තිලයන් ජය ලබත්ම, විණා නාදය දියුණු වූයේ පැමිණි ජය ගොස ලොව පතළ කරමින් යන්නාක් මෙනි. එය කෙමෙන් දියුණු වූ බැවින් ඒ නාදය යම් දුරකට ගියේ නම්, එහි සිට එය ඇසුවෝ තුටු ව රන් මුතු මිණි ඉස්සාහ. අවසන ඒ නද සිය සිය ගුණයෙන් දියුණු විය. එවිට නික්මුණු වෙණ නද කොතරම් තියුණු වී ද කියතොත් පැතිර ගියා වූ ජය නාදය ප්‍රතිරාව නංවන්නා වැනි විය.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

15 පිය සන් නො ව බිඟු දැල් රැඳී කොපුලි
අවසන් නො ව වෙණ නදට ම කුහුලී
මද සන් සුන් පියොවින් සිටි නොසැලී
ගජ සෙන් සිතියම් ගජ සිරි කියෙලී

අර්ථය

අවසන් නො වූ වීණා නාදයට ම කුතුහලයෙන්, මද කිපුණු ඇත් සේනාව මද සන්සිදුණු ලෙස සිතුවම් සේ කන් නොසොල්වා නොසැලී සිටි බැවින්, දෙකොපුලින් ගලන මද ජලය පානය කිරීමට මී මැස්සන්ට පියා නොසලා කොපුල් තුළ සිටීමට හැකි විය.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

16 කන් කලු වෙණ නද ඇසුමෙහි ලොබිනේ
රන් රසු දැල් කෝලහල වන බියෙනේ
සන් සල නොව එහි පිළිරු ලෙසිනේ
නන් හය සෙන් සිටියෝ සිටි මතිනේ

අර්ථය

කන් පිනවන වීණා වාදනය ඇසීමේ ලෝභ වූ නොයෙක් වර්ගවලට අයත් අශ්ව සේනාවෝ, සෙලවුනොත් ගෙලෙහි බැඳි රන් මිනි ගෙඩි වැල් ශබ්ද වේ යැයි බියෙන් නො සෙල්වී පිළිම සේ සිටියෝ හ.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

17 නීති නිරිඳුගෙ රැකවලෙහි නියුත්තෝ
රුති ලෙස රුපුනොද බිඳ ජය ගත්තෝ
පැති රෙන වෙණ නද බැඳුණු සිතැත්තෝ
ඇති නවි ගිලිහෙන බව නොම දත්තෝ

අර්ථය

සිතූ පරිදි සතුරන් පරාජ කිරීමෙහි සමත්, නිරන්තරයෙන් රජතුමාගේ ආරක්ෂාවේ නියුතු සෙබලුන්ගේ සිත් වීණා වාදනයෙහි ආසක්ත වූ බැවින්, ඔවුන්ටන් නොදැනුවත්ව ම අත්වල තිබූ ආයුධ බිම වැටුණි.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

18 මන මත් කරවන දන මුළු දෙරණා
රසවත් වන වෙණ නද නද කරණා
සවනොත් සඳ පුරහන ලොබ දිවුණා
නොදනිත් දරුවන් ඇකයෙන් වැටුණා

අර්ථය

පොළෝ තලයෙහි ම ජනතාවගේ සිත් සතුටු කරවන, රසවත් වීණා නාදය ශ්‍රවනය කළ පුරයේ කාන්තාවන්ගේ ආශාව වැඩි වීමෙන්, ඔවුන්ටත් නොදැණුවත්ව ම උකුලෙහි සිටි දරුවන් බිම වැටුණි.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

19 පන් සිළු වීණා නද පසු බැස්වූ
මන් පිනවන වෙණ නදයෙන් තොස්වූ
නන් දන කැන් දුටුවද බිය සිස්වූ
මින් රළවුත් ගං වෙරළට රැස්වූ

අර්ථය

පංචසිඛගේ වීණා නාදය ද පසු බැස්වූ, සිත් තුටු කරවන වීණා නාදයෙන් සන්තෝෂ වූ විවිධ ජන සමූහය දුටුව ද, බිය පහව ගිය මාළු රංචු ගං වෙරළට රැස්වූහ.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

20 වර වෙණ නද අසමින් සිත සතොසිනි
සර හැර සියොතුන් පියාපත් විදමිනි
පුර ඔර වසමින් සිටි රඟ කුම් වැනි
සුර සෙනඟට සුරසුන් පැනවූ වැනි

අර්ථය

උසස් වීණා වාදනය ඇසීමෙන් සතුටට පත් පක්ෂීන් ගමන් හැර, පියාපත් විදහා ගෙන ම අහසේ සිටීම පෙනුණේ දිව්‍ය සේනාවට දිව්‍යාසන පනවා තිබෙන්නාක් මෙනි.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

21 යොදා සවන් වෙණ නද රස සුලබව
නඳා එකඟ සිත් වත නො ම සකොබව
සදා කුලය නොහැර ම එන අසුබව
එදා ගියේ රිළවුන් සන්නල බව

අර්ථය

පහසුවෙන් ඇසෙන්නා වූ වීණා වාදනයට කන් යොමා, සිත් සන්සුන් වූ රිළවූ සතුටින් එකඟ වූ කල්හි, පරම්පරා පුරුද්දෙන් පවත්වාගෙන එන්නා වූ අශෝභන චංචල ස්වභාවය/දුර්ගතිය පහව ගිය සේය.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

22 එමා සත්හු වෙණ නද අසමානය
සමා නො වෙති කොවුලෝ උපමානය
තමා නාද මිහිරැයි යන මානය
දමා එයින් වින්දෝ අවමානය

අර්ථය

ඒ මහා සත්වයාගේ වීණා නාදයට සම වීමට කොවුල් නාදයට නොහැකි වීමෙන්, සිය නාදය මිහිරි යැයි මානයෙන් සිටි කොවුලෝ අවමානයට පත්වූහ.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

23 අසන රිසින් නයි කැල ඔසළෝයා
ඔවුන වෙත ම සිටිනා ගුරුළෝයා
වයන එ වෙණ නද ලොබ ම කළෝයා
එදින වයිර සිත සිහි නො කළෝයා

අර්ථය

නාග සමූහය ද වීණා නාදය අසන රිසින් රැස්ව සිටිය දී, මිහිරි වීණා නාදයට රුචි වූ ගුරුලෝ ද ඔවුන් අසලින්ම රැස්ව සිටියේ එදින වෛරී චේතනාව අමතක වූ සේ ය.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

24 බැඳී දන මන වැයුමෙහි ඇඳුරෝයා
විදි සත්සර වෙණ සර මඳුරෝයා
රැඳී සතොසින් සැනහුණු ඉඳුරෝයා
වැඳී දන සිරි ගත්තුය කිඳුරෝයා

අර්ථය

ජනයාගේ සිත් ගන්නා සුළු වූ බෝධිසත්ව ආචාර්යවරයාගේ මඳුර වූ සප්ත ස්වර නාදය විඳීමෙන් සතුටු ව, සැනසුණු ඉන්ද්‍රියන් සහිත කිඳුරෝ වන්දිභට්ටයන් සේ විය.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

25 සතොස් කරන විණා නද ඇසුමට
නොගොස් සිටින පිල්බර ගණ ගොදුරට
වෙසෙස් රුවින් තම මැවුවත් බඹහට
සඳැස් සවන් නොකළැයි වූ නොසතුට

අර්ථය

සන්තෝෂ කරවන වීණා නාදය ඇසීමේ ආශාවෙන් ආහාර සොයා නොගොස් සිටි මොනර සමූහයා, වඩා හොඳින් වීණා නාදය ඇසීමට හැකි වන සේ සිය පිල් අග ඇස් ලකුණු කන් නොකළේ යැයි බ්‍රහ්මයා කෙරෙහි අසතුටින් පසු විය.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

26 වෙසෙසින් යන නද දිගත පුරායා
අසමින් තුරු හිස රඳන ගිරායා
උමුවෙන් ගත් මී අඹ මියුරායා
දැමුවෙන් වෙණ නද ම ය මියුරායා

අර්ථය

ගස් මුදුන්හි මී අඹ කමින් සිටි ගිරවු දිශාන්තරයෙහි පැතිරයන විණා නාදයේ මිහිරි බව ඇසීමෙන් එම නාදය මිහිරි මී අඹ පරදවන හෙයින් මී අඹ ඉවතට දමති.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

27 රුති වනපෙතිනැවිදින් සුමුවෝයා
නීති මියුරුති වෙණ නදළමුයෝයා
සිතිවිලි නැති රූ විලස මුවෝයා
නැති නොගනිති මිනිසුන් සමුවෝයා

අර්ථය

සුන්දර වන පෙතින් රංචු පිටින් පැමිණ, මිහිරි වීණා නාදයට අරින ලද මුඛය ඇති මුවන්, සිතිවිලි නැති රූප ලෙස මිනිසුන් දැක බිය නොවීය.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

28 නොගොසින් සිට සිටි වන නිබඳේයා
වෙසෙසින් සුර නර සෙන් නො මඳේයා
සතොසින් විඳ විඳ ලොබ නො සිඳේයා
මෙලෙසින් වෙණ නද අසන සඳේයා

අර්ථය

දිව්‍ය මනුෂ්‍ය මහා සේනාව නොගොසින් සිටි තැන්වලම සිටගෙන නොසිඳුණු ආශාවෙන් විණා නාදය ශ්‍රවණය කරන කල්හි.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

29 පටන් සුරිඳු දුන් උපදෙස් සිහි කොට
ඉටන් බෙලෙන් දැමුවෙන් ගුළි අහසට
තුටන් වඩන සුර අඟනෝ බැස සිට
පටන් ගත්තු නව සියයක් නැටුමට

අර්ථය

පළමුව සක් දෙවි දුන් උපදෙස් සිහිකොට, අධිෂ්ඨාන බලයෙන් ගුලි අහසට දැමූයෙන්, සතුට වර්ධනය කරවන සුර අඟනන් නවසියයක් බැස නැටුමට පටන් ගත්හ.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk